පසු අන්ත මානසික පීඩණයට ලක්වූ දියණියකි. පියා විවාහ කරගත් කුඩම්මා සහ ඇයගේ දූවරු දෙදෙනාගේ හිංසනයට හා අවතක්සේරුවට ලක් වූ සිනඩරෙල්ලා ළමා ලෝකයේ කඳුලක් ම වූවාය. ඇය ලබා තිබූ රූප සම්පත්තියට ඇති වූ ඊර්ෂියාව ඇයට අපලයක් විය. කුඩම්මා නිවසේ සියළු වැඩ කටයුතු පමණක් නොව ඇයගේ දූ වරුන්ගේ සියලු බැලමෙහෙවරකම්ද ඇය පිට පැටෙව්වාය. ඇයට ලැබුනේ ඉතිරි වූ කෑම බීමය. ඇන්දේ පරණ ඇඳුම්ය. ඇයට සින්ඩරෙල්ලා නම ලැබුණේද ඇයගේ නිදන කාමරය උදුන් කාමරය වූ නිසාය.

දිනක් රටේ රජතුමා තම පුත් කුමරාගේ සාදයකට රටේ වැදගත් සැමට ඇරයුම් කළත් සින්ඩරෙල්ලාට ඊට අවස්ථාව නොලැබුණි. මෙය කුමරියක් තෝරා ගැනීමට කුමරුට අවස්ථාව සලසා දුන් මොහොතක්ද විය. කුඩම්මා දියණියන්ද සින්ඩරෙල්ලා ලවා සරසා ගෙන උළෙලට ගිය පසු, තනිවී සන්තාපයට පත් සින්ඩරෙල්ලා තම මව සිහි වී කඳුළු වගුරන්නට විය. මොහොතකින් මව් දෙවඟන එහි පෙනී සිට දුක්වීමට හේතු විමසුවාය. දියණියටද මාලිගා සාදයට යාමට අවශ්‍ය ඇඳුම් පැළඳුම් ආදිය පමණක් නොව විසිතුරු අශ්ව රියක්ද ලබාදුන් මව ඇයට ආශිර්වාද කළාය. ඇයට වශී වූ කුමරු ඇය සමඟ රංගනයක යෙදුණි. කතාන්දරය නිමවෙන්නේ පසු දිනක ඇයව සොයා එන කුමරා සහ පිරිස සින්ඩරෙල්ලා රාජකුමරියක් ලෙස තෝරා ගැනීමෙනි. 1967 දී චාල්ස් පෙරෝල්ට් විසින් ප්‍රබන්ධිත මෙම කතාව මෙම 21 සියවසයේදී පවා විවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රතිනිර්මාණය වූවකි.



1812 දී පමණක් ජැකොබ් ග්‍රීම් හා විල්හෙල්ම් ගීට් නම් දෙසොයුරන් විසින් රචිත "පැන්සල සහ ග්‍රේටල්" සොහොයුරකු හා සොහොයුරියකට තම කුඩම්මා මුල්කොට ගෙන මුහුන පාන්නට වූ ත්‍රාස්සජනක ඉරණම පිළිබඳ ලෝක ප්‍රසිද්ධියට පත් වූවකි. කුඩම්මා පියාට හොරෙන් මේ දරුවන් දෙදෙනා වනයක අතරමං කර විනාශ කිරීමට ගත් මොහොතේ මායාකාරියගෙන් බේරී නැගෙනිය සමඟ බේරී යාමට ගත් වීර ක්‍රියාවකින් එහි අන්තර්ගතය පොහොසත් ය. එම කතා පුවතක්ද විවිධ නිබන්ධන, චිත්‍රපට වීඩියෝ දර්ශන බවට පත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ රුසියානු කතාන්දරයන් වූ මාෂා සහ වලසා, රතු හැට්ටකාරී, යෝධයාගේ උයන වැනි කතාන්දරවලද අන්තර් ගතය වැඩිහිටි ලෝකය තුළ ළමා ලෝකයේ රිදී රේඛාවක් සනිටුහන් වී තිබීම පොදු ලක්ෂණය වේ. ළමා ලෝකය වැඩිහිටියන්ගේ දෛනික ප්‍රශ්ණාවලින් වෙනස් වූ සුන්දර ලෝකයකට ළමයා කැඳවාගෙන යාමකි. අද දිනයේ වුවද ළමා හා යෞවන වයසේ ගත කරන බොහෝ දරුවනට ඉහත සඳහන් කතාන්දරවල සංසිද්ධීන්වලට සමාන සිද්ධීන්ට දරුවනට මුහුණපෑමට සිදුවේ. සෑම කතාන්දරයකින්ම ළමා ජීවිතයට අමතන හෙයින් එවැනි තත්වයන්ට මුහුණපෑමේ ආත්ම ශක්තියක් මෙන්ම පෙරහුරුවක් විඳ ගැනීමට ඉඩප්‍රස්ථා ලබාදෙයි. ළමා වයස ලෙස සැලකෙන බිළිඳු අවධියේ සිට වයස 14 දක්වා දරුවන්ට නිර්මාණය වී ඇති සිගිති තේමාවලින් ඔබ්බට නව යොවුන් හා යොවුන් වියට සරිලන කතාන්දර සාහිත්‍යයක් වෙනම පවතී. සත්ව ලෝකයෙන් බැහැරව, පොදු මිනිස් සන්තානයන්ට නැඹුරු වූ ස්ත්‍රී පුරුෂ ප්‍රබල හා දුබල පෞරුෂ ලක්ෂණ අන්තර්ගත වීම ඒවායේ පොදු ලක්ෂණය වේ. ඇතැම් වැඩිහිටි කතන්දරවල එන සුරංගනා චරිත මිනිස් චරිතවල සංකේතාරථයන්ය. සුරංගනා කථාවලට ප්‍රකට හාන්ස් ඇන්ඩර්සන්ගේ කතාවල එන සෑම මිනිස් චරිතයක්ම දෙවියන්ගේ ඇඟිලි තුඩුවලින් ලියැවුනු ඒවා ලෙස සැලකෙන්නේ සැබෑ මනුෂ්‍යත්වය දේවත්වයට ලං වූවක් බව දක්වමිනි. එයින් පැහැදිලිවන්නේ කථාන්දරයක් යනු හුදෙක් විනෝදය සපයන ප්‍රබන්ධයක්ම නොව, රසයෙන්, අර්ථයෙන්, ධර්මයෙන් පිරිගිය සාහිත්‍ය නිර්මාණයක් වන බවයි.

කතාන්දර කලාව පොදුවේ සෘජුව ළමයින්ට ආමන්ත්‍රණය කරන රචනා ශෛලියකින් - යුක්ත වූවකි. ඒ ඒ චරිත ළමයින්ට අමතන සංවාද සමඟ මිතුරු වෙති. ගස් - කොළ - කුරුළු - සිව්පාවුන් පවා හසුරුවන්නේ ළමා භාෂාවයි. සියළු සිතුම් පැතුම් සමවේ. කතාන්දර ලෝකයේදී ළමයා මානසිකව හා ශාරීරිකව සැහැල්ලු වීමට බලපාන්නේ මෙම ආකෘතියයි. එහෙයින් කතාන්දර අසන - රඟන ළමෝ නටති - ගයති වයති. දුවපැන දඟලති. හඬති. සිනාසෙති. ඒ මොහතෙ ඔවුන්ගේම ජීවිතයේ පෙත්තක් බවය පත් වීම ඊට හේතුවයි. ළමා නාට්‍යය ප්‍රේක්ෂකාගාරයක් දෙස විමසන විට මේ ස්නාභාවය මනාව නිරීක්ෂණය කළ හැක. ළමා කතාන්දර පොතක පවා චිත්‍ර හා රූප මගින් මෙම සජීවී බව දැකිය හැකිය. ළමයා යනු ලෝකයෙහි යථාර්තය තේරුම් ගැනීමේදී ලෝක ස්වභාවය දෙස කුතුහලයෙන් අධ්‍යනය කරන ක්‍ෂුද්‍ර ප්‍රාණියෙකි. එහිදී බුද්ධි කදම්බනය මනෝවිද්‍යාත්මක ශක්තිය 18 - 19 සියවස්වලදී විද්වත් අවධානයට යොමු වීම එය ළමා ලෝකයට ආශිර්වාදයක් වීමට හේතුවිය. එය මානවයාට කියවීමට හා ලිවීමට නොදන්නා සමයෙහි සමාජය අවදිකල එකම නොවිධිමත් පාසල වූ බව පිළිගැනේ. වැඩිහිටියන් පවා දැනුම කුසලතා ආකල්ප වඩා ගැනීමට ..... කලාවක් ලෙද කතාන්දර ගෙත්තම පරම්පරාවෙන් පරම්පරාවට සුරැකිව දයාද කරදුන් ශාස්ත්‍රීය සම්පතක් ලෙස හඳුනාගෙන ඇත.

ළමා පරපුරෙහි සමබර පෞරුෂය වර්ධනය කිරීමේදී කතාන්දර කලාව මෙසේ මානසික සමබරතාව, ස්ථානෝචිත ප්‍රඥාව. නායකත්වය. සමාජානුයෝගය නැකි පෞරුෂ සම්පත් සමඟ භාෂා හා සාහිත්‍ය කුසලතා වර්ධනයේදී ප්‍රමුඛපෙලේ ආශිර්වාදය වන බව පැහැදිලිය. වර්තමානයේ විශ්ව කතාන්දර රාශියක් සිංහල බසින් පළවී ඇති හෙයින් සංක්‍රමණික ජනතාවගේ දූ දරුවන්ම ඒවා පරිහරණය කිරීමේ උරුමය පවරාදීම වැඩිහිටියන්ගේ පරම යුතුකමක් ලෙස සැලකිය යුතුය. දිනෙන් දින තාක්ෂණික මෙවලම් සමඟ තනිවන දරුවා නූතන සමාජය තුල තමන්ගේ මව්බසින් කතා කරන්නට සිතන්නට හා නිර්මාණ කරන්නට නොහැකි යුරෝපීය සමාජයේම කොටසක් කිරීම, මෙරටට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකීය අපගේ අභිලාෂය නොවන බව අමතක කළ නොහැකිය.

